# $CO_2$ ඇබ්බැහියෙන් මිදෙමු!

## කාබන් අවම ආර්ථිකයක් කරා...

ලොව පුරා සිදු වන දැවැන්ත පාරිසරික ව්‍යසනයන් සහ එහි ප්‍රථිපල මානව වර්ගයාගේ පැවැත්මට එල්ල කර ඇති තර්ජනය හමුවේ ඔබ සියලුම දෙනා සමඟ පරිසර ආරකෂාව පිළිබඳව දොඩලු වන්නට සිදුව ඇත.

දිනෙන් දින සුළි සුළං, ගංවතුර, නියඟ, නායයෑම්, භූමිකම්පා වලින් වැළලෙන ජීවිත සංඛ්‍යා ප්‍රකාශයට පත් වේ. එමෙන්ම අලුත්, අලුත් වසංගත එන්න එන්නම වැඩිවෙමින් පවතී.

මෙවන් අභියෝග හමුවේ අප තවමත් ජීවත්ව සිටීමට වාසනාව ලද්දෝය. නමුත් සුළි සුළං, ගංවතුර, නියඟ, නායයෑම්ල භූමිකම්පාල වසංගත වලින් අපත් මොනයම් හෝ මොහොතක වැනසෙනු ඇත. ඊට පෙර මේ වසංගතයෙන් මිදීමට කළ හැකි යමක් වේද?

මිනිසුන් ඔලු ගණනින් වැඩිවේ. ඒ සමඟම ඒ මිනිසුන්ගේ ආශාවන් ද වැඩිවේ. මේ වැඩිවන මිනිසුන්ගේ කුස පුරවමින් නොසිඳෙන ආශා පිනවීමට ලොව පුරා තිබෙන සියලු ස්වභාවික සම්පත් වැඩි කිරීමට සිදුව ඇත. නමුත් මේ සියලු අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට සොබාදහම අසමත්ය. එහි ප්‍රථිවිපාක අප මෙසේ විඳින්නෙමු. (කාබන්ඩයොක්සයිඩ්) එක් විටෙක එක්තරා දුරකට අපට අවශ්‍ය වන වායුවක් වුව ද අද එය ලෝකයම වනසන මහත් හානිකර වායුවක් බවට පත්ව ඇත. අප වෙනුවෙන් ලෝකය පුරා නිෂ්පාදනය වන සෑම භාණ්ඩයක් වෙනුවෙන්ම කාබන්ඩයොක්සයිඩ් අපේ වායුගෝලයට එකතු වේ.

මේ නිසා ලෝ තලය උණුසුම් වීම ඇතුළු දේශගුණික විපර්යාස රැසක් සිදු වේ.

එසේ නම් අප වැඩි වැඩියෙන් භාවිතා කරන, නාස්ති කරන සෑම දෙයක් වෙනුවෙන්ම ස්වභාවික සම්පත් නාස්තියක් මෙන්ම කාබන්ඩයොක්සයිඩ් වායුගෝලයට එක් වීමක් සිදු වේ.

තවමත් අප සිතන පතන අධි පාරිභෝජන සංවර්ධන සිහිනය වන ගොඩනැගිලි, මහාමාර්ග යාන-වාහන වලින් පිරි ජීවිතය මරණයෙන් කෙළවර වීමට පසුබිම දැන් සැකසී ඇත.

සංවර්ධිත යයි කියාගන්නා බොහෝ රටවල් මෙන්ම සංවර්ධිත රටක් වීමට පෙරුම් පුරන අප රට ද මේ සංවර්ධන සමනළ සිහිනයේ අතරමංව හිමිහිට මරණයට ගොදුරු වෙමින් සිටී.

එසේ නම් තවදුරටත් වෙළෙඳපළ මත පදනම්ව ආහාර බුදිමින් ඉන්ධන, විදුලිය ඇතුළු දේ නාස්ති කරමින් සිටින්නේ ද? අපිම වවාගෙන කා බී සියලු සම්පත් අරපිරිමැස්මටත් සංරක්ෂණයටත්,සහජීවනයටත් මේ ජීවන රටාව වෙනස් කර ගන්නේ ද?

වත්මන් ජීවන රටාවේ ඇබ්බැහියෙන් මිදිය හැකි නම් හෙට සිදුවන මහ විපත නවතාලීමට අපට හැකි වනු ඇත.

නාස්තිකාර ජීවන රටාවේ ඇබ්බැහියෙන් මිදී කාබන්ඩයොක්සයිඩ් අවම කර ස්වයංපෝෂී,සමබල තිරසාර සංවර්ධනයක් ආර්ථිකයක් වෙනුවෙන් වෙහෙසවෙමු! කැපවෙම !

වැඩ කරමු!

ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය
අංක 09, පළමු පටුමග, විනාත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
Tel : + 94 - (0)11- 2817156 Fax : + 94 - (0)11- 4305274 Web: www.greensl.net E -Mail: office@greensl.net